ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


Article 12(1)

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2019.08.08

පැමිණිලි පාර්ශවය : වයි.කේ.බී.කේ. විජේසිංහ මයා,
අංක. 308/15, වරාතැන්න,
හල්ලොළුව,
මහනුවර.

වගඋත්තරකාර පාර්ශවය : විදුහල්පති,
මහ/කිංස්වුඩ් විද්‍යාලය,
මහනුවර.

පැමිණිලි අංකය : **HRC/K/660/16**

**පැමිණිල්ලේ සැලකිරීම :-**

උක්ත පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින් ප්‍රකාශ කර ඇත්තේ, තමා 2017 පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමට අදාළව මහ/කිංස්වුඩ් විද්‍යාලයට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම්පතක් ඉදිරිපත් කළ බවත්, ඒ අනුව සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලකුණු 90 ක් ලබාගත් නමුත් ළමුන් තෝරාගත් නාමලේඛනයේ තම දරුවාගේ නම ඇතුළත් වී නොතිබූ බවත්ය. තමාගේ දරුවා ලකුණු 90 ලබාගෙන තිබියදීත් ලේඛනයේ ලකුණු 83 දක්වා ලකුණු ලබාගත් දරුවන්ද ඇතුළත් කර තිබූ බවත්, ලකුණු 74 දක්වා ලකුණු ලැබූවන් පොරොත්තු ලේඛනයට ඇතුළත්ව තිබූ බවත් සඳහන් කර ඇත.

මේ සම්බන්ධයෙන් තමා අභියාචනාවක් ඉදිරිපත් කළ පසු අභියාචනා පරීක්ෂණයේදි තමා සතු සියළු ලේඛන ඉදිරිපත් කළද ඒවා පිළිබඳව අවධානය යොමු නොකර තමා අදාළ ස්ථානයේ පදිංචි නොමැති බව අභියාචනා මණ්ඩලය ප්‍රකාශ කර සිටි බවත්, පරීක්ෂණ මණ්ඩලය නිලධාරීන් ස්ථාන පරීක්ෂාවට පැමිණෙන විට තම බිරිඳ සහ දරුවන් එම ස්ථානයේ සිටි බවත්, තමා මේ සම්බන්ධයෙන් විදුහල්පති හමු වූ විට ඔහුද ඒ සම්බන්ධයෙන් කිසිවක් කළ නොහැකි බව ප්‍රකාශ කළ බවත්, ඒ අනුව තම පදිංචි ස්ථානයේ කිසිවකු




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com

නොසිටි බව පවසමින් ලකුණු 90 ක් ලබා සිටි තම දරුවා පාසලට ඇතුළත් කර නොගැනීමට කටයුතු කර ඇති බවත් සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවීය සැලකිරිම :-**

පැමිණිල්ලට අදාළව වගඋත්තරකාර මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිෂන් සභාව වෙත කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරුගේ දරුවා 2017 වර්ෂයේ පළමු වසරට ඇතුළත් කිරීමට අදාළව පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවත්, අදාළ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ පැමිණිලිකරු එහිදි ලකුණු 90 ක් උපයාගෙන ඇති බවත්, ඉන් අනතුරුව අයදුම්කරුවන්ගේ පදිංචිය භෞතිකව සනාථ කර ගැනිමට ස්ථාන පරීක්ෂණ කණ්ඩායමක් නිරීක්ෂණ සඳහා යෙදවූ අවස්ථාවේ පැමිණිලිකරුගේ බිරිඳ සහ දරුවා එම ස්ථානයේ සිටියද ඔවුන් එම ස්ථානයේ ස්ථිරවම පදිංචි නොමැති බව ඊට ආසන්න පදිංචිකරුවන්ගෙන් දැනගැනිමට හැකිවූ බවත් සඳහන් කර ඇත. එම තත්වය මත පැමිණිලිකරුගේ නම තාවකාලික ලේඛනයට ඇතුළත් නොකළ බවත්, අදාළ චක්‍රලේඛනය අනුව අභියාචනා මණ්ඩලයේද නිර්දේශ අනුව පැමිණිලිකරුගේ නම අවසන් ලැයිස්තුවට ඇතුළත් නොකල බවද සඳහන් කර ඇත.

**විමර්ශන හා පරීක්ෂණ කටයුතු වලදි අනාවරණය වූ කරුණු :-**

පැමිණිලි පාර්ශවය සිය දරුවා 2017 වර්ෂයේ මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට ඇතුළත් කර ගැනිම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම්කර සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු 90 ක් ලබාගෙන ඇති නමුත් දරුවා පාසලට ඇතුළත් කර නොගැනිම සම්බන්ධයෙන් උක්ත පැමිණිල්ල ඉදිරිපත් කර ඇත. පදිංචිය තහවුරු කර ගැනීම සඳහා ස්ථාන පරීක්ෂණය සිදුකරන අවස්ථාවේ පැමිණිලිකරු පදිංචි ස්ථානයේ නොසිටියද පැමිණිලිකරුගේ භාර්යාව හා දරුවන් සිටියදි පදිංචිය තහවුරු නොවන බව සලකා කටයුතු කිරිම හේතුවෙන් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ අභියාචනයට අනුව අභියාචනා පරීක්ෂණයේදි නැවත ස්ථාන පරීක්ෂණයක් සිදු කළ යුතු බව අභියාචනා මණ්ඩල සභාපති විසින් සටහන් කර ඇති නමුත් ස්ථාන පරීක්ෂණයක් සිදුකර නොමැත. චක්‍රලේඛනයේ 10.10 වගන්තිය අනුව අභියාචනා පරීක්ෂණවලදි නැවත පදිංචිය පිළිබඳ ස්ථාන පරීක්ෂණ සිදුකිරිම අභියාචනා මණ්ඩලයේ වගකීම වුවද අභියාචනා මණ්ඩලය එම වගකීම පැහැර හැර ඇති බව තහවුරු වේ. <u>දෝන දිනායා නම්දිනි විජයවීර</u> එරෙහිව <u>බී.එම් වීරසූරිය, විදුහල්පති, විශාඛා විද්‍යාලය සහ වෙනත් අය</u> යන නඩු තීන්දුවෙහි පදිංචිය තහවුරු කිරීමට නොහැකි වීම හා ඊට අදාළව නොමඟයවන සුළු සහ වැරදිතොරතුරු ලබා දීම මත අදාළ පෙත්සම නිශ්ප්‍රභා කළද, එසේ කිරීමට ප්‍රථම අධිකරණය විසින් සළකා බැලූ විශේෂ කරුණක් වූයේ පදිංචිය තහවුරු කර ගැනීම සඳහා පාසල් නිලධාරීන් අවස්ථා තුනකදීම ක්ෂේත්‍ර පරික්ෂණයක් සිදුකොට ඇති බවයි. ඒ අනුව එහි ප්‍රකාශ වී ඇත්තේ පදිංචිය සනාථ කර ගැනීම සඳහා පාසල් නිලධාරීන් අවස්ථා

තුනකදීම එම ස්ථානයට ගොස් පරීක්ෂා කිරීම හේතුවෙන්, පාසලෙහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් කිසිදු වරදක් අධිකරණය නිරීක්ෂණය නොකරන බවයි. මෙම පැමිණිල්ලේදී අභියාචනා මණ්ඩලය එළෙස මෙම පැමිණිලිකරුගේ පදිංචිය නිසි ලෙස තහවුරු කරගැනීමකින් තොරව පැමිණිලිකරුගේ පදිංචිය තහවුරු නොවන බවට තීරණය කර අවශ්‍ය ලකුණු ලබාගෙන තිබෙන පැමිණිලිකරුගේ දරුවා පාසලට ඇතුළත් කර නොගැනිම පැමිණිලිකරුට සිදුකළ බලවත් අගතියක් බව නිරීක්ෂණය වේ. තවද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින්ද භාර්යාව හා දරුවන් සිටියද පදිංචිය තහවුරු නොවන බව දක්වා සිටියද පදිංචිය තහවුරු නොවීමට හේතු දැක්වීමක් හෝ ඒ පිළිබඳ කරුණු තහවුරු කිරීමක්ද කර නොමැත.

නිගමනය :-

පැමිණිලිකරුගේ දරුවා 2017 වර්ෂයේ මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට ඇතුලත්වීමට අවශ්‍ය ලකුණු ලබාගෙන තිබියදි පදිංචිය තහවුරු කර ගැනිමට සිදුකළ පරීක්ෂණයේදි පැමිණිලිකරුගේ භාර්යාව හා දරුවන් නිවසේ සිටියද පදිංචිය තහවුරු නොවූ බවට සලකා පැමිණිලිකරුගේ දරුවා තෝරා නොගැනීමෙන් හා අභියාචනා මණ්ඩලයේ සභාපති විසින් නැවත පදිංචිය තහවුරු කළ යුතු බවට දක්වා එය ක්‍රියාත්මක කිරීමෙන් තොරව අත්තනෝමතිකව කටයුතු කිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති සර්ව සාධාරණත්වයේ මූලික අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශ :-

1. පැමිණිලිකරුගේ දරුවා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කිරිමට වගඋත්තර පාර්ශවය විසින් පියවර ගත යුතුය.

2. අභියාචනා මණ්ඩලය විසින් නිසි පරිදි චක්‍රලේඛනය ආදේශ කර නොගනිමින් පැමිණිලිකරුගේ දරුවාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ඇති බැවින් එම මණ්ඩලයට එරෙහිව විනය පියවර ගැනීමට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කටයුතු කළ යුතු බවද මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019. 09. 09 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 01. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මයා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/